# පුවක් වලින් වැඩි ආදායමක් ලබමු

**ස්වර්ණා අබේසිංහ මිය**
**තාක්ෂණික සේවා අංශය**

## හැඳින්වීම

පුවක් Palmac පවුලට අයත් Arica Genus වර්ගයට අයත් තාල වර්ගයට අයිති ගසකි. මෙහි ප්‍රභේද 76 ක් ඇත. මෙහි තනි කඳ පවතින අතර, ගස් පඳුරු වශයෙන් පවතී. ගසෙහි සාමාන්‍ය උස මීටර 10 ක් පමණ වන අතර, කඳෙහි පරිධිය සෙ.මී. 35-60 ක් අතර පවතී. පත්‍ර පහක් හා මුළු වසා ගැටයක් සෑදේ. කඳේ පරිවය සෙ.මී. 10 ක් පමණ වේ. තන්තුමය මුල් කඳ වටා සෙ.මී. 60 ක් පමණ දුරට පැතිරී යයි. මුල්වල පවතින එලයන් සංඛ්‍යාව අනුව ගසේ වයස කිව හැකිය. පුවක් ශාකය නිසා අනිත් ශාකවලට හානියක් සිදු නොවේ.

ගසෙහි පිරිමි මල විශාලය. පිරිමි මල සහ ගැහැණු මල එක ඉත්තක පවතී. නිපත්‍ර ඇරුණු දින සිට දින 07 ක් තුළ පරාග නිකුත් කෙරේ.

පුවක් ගස සම්ප්‍රදායික භෝගයක් ලෙසත්, මිශ්‍ර වගාවක් ලෙසත්, රට පුරා වගාකර ඇත. මෙය තනි වගාවක් ලෙසද කෙටි කාලීන බෝග සමග පවතින වගාවක් ලෙසද වගා කළ හැකිය. අලුතින් පුවක් සිටුවීම කළ හැකිය. පුවක් කෙටිකාලින භෝගයක් වන අතර, එලදාව දැරීමට අවුරුදු 05 ක කාලයක් ගත වේ.

## පුවක්වල ප්‍රයෝජන

පුවක් ගස ලංකාවේ වෙසක් සහ පොසොන් මාසවලදී තොරණ සඳහා භාවිතා කෙරේ. ග්‍රාමීයව වවන පුවක් ගස දැනට ලංකාවේ වඳවී යන ශාකයක් බවට පත්වී ඇත. එසේ වූවත් එහි ප්‍රයෝජන බොහොමයක් ඇත. ලංකාවේ ග්‍රාමීය නිවෙස් සඳහා ආදී කාලයේ තිබූ පැල්පත් බොහොමයක වහලය පුවක්පටි වලින් සකස්කර පොල් අතු හෝ පිදුරු වලින් සෙවිලි කළ ඒවාය. මේ සියල්ල කාලීනව වෙනස්වී ඇතත්, පුවක් ගසේ සමහර ප්‍රයෝජන ලබා ගනිමින් මුදල් උපයන අය, අප රටේ මෙන්ම විදේශ රටවල ද නවමත් සිටී.

පුවක් ගෙඩියේ විවිධ අවස්ථාවන් උපයෝගි කරගෙන ඇල්කොලයිඩ - සංයෝග සෑදීම සහ ටැනින් - වර්ණක ඩයි වර්ග නිස්සාරණය සඳහා ද භාවිතා කෙරේ. පුවක් ශරීරයේ අභ්‍යන්තර පරිභෝජනය සඳහා ද, පණුරෝග සුවවන ඖෂධයක් ලෙසද, නිර්වින්දන ඖෂධ සෑදිම සඳහා ද, තුවාල සුව කිරීමට ඖෂධයක් ලෙස ද භාවිතා කෙරේ.

පුවක් මුල මුඛ සෝදන දියර සෑදීමට ගනු ලබයි. අමු පුවක් සහ කහට පුවක් හරකුන්ගේ පණු අමාරු සඳහා උපයෝගි කරගන්නා බෙහෙතකි. පුවක් වෙලා ලබා ගන්නා කරුංකා රසකාරකයක් ලෙස සෑපීමට යොදා ගනී. පුවක් රසකැවිලි සඳහා ද යොදා ගනී. ඉදුණු පුවක් ගෙඩියේ පැණි විෂබීජ නාශකයක් ලෙස භාවිතා කෙරේ.

පුවක් පැල සහ ගස විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයට ගන්නා අතර, අවුරුද්දක් වයසැති පුවක් පැල අපනයනය කිරිම සිදු කෙරේ. පුවක් අතු, දරණු සකස් කිරීමට උපයෝගි කරගනු ලැබේ.

පොල්වගාව මෙන්ම පුවක් වගාව "මී මැසි පාලනයට" ද යෝග්‍යය. පුවක් ලීය වඩු ඇණ සකස් කිරීමට පළතුරු ගබඩා කිරීමේ රාක්ක නිෂ්පාදනයට - ගෙවල දුම සකස් කිරීමට - පොල්කටු හැඳි නිෂ්පාදනයේදී මිට සකස් කිරීමට උපයෝගී කරගනු ලැබේ.

පුවක් කොළය ගෙදර දොර භාවිතයේදී, පලා ලිවීම වැනි කාර්ය සඳහා යොදා ගන්නා අතර, පැණි නිෂ්පාදනය කිරීමේදී පරිසර හිතකාමී ඇසුරුමක් සකසා ගැනීමට යොදා ගැනේ.

පුවක් අත්තෙන් නෙලා ගන්නා ඉරටු වර්ණ ගා... කලාත්මක භාණ්ඩ නිෂ්පාදනය ද, අතුගෑමට සකස් කරන ඉදල හා සමාන උපකරණ සකස් කිරීම සිදු කෙරේ. සමහර එළවළු ඇසුරුම් සඳහා ද පුවක් ගසේ විවිධ කොටස් උපයෝගි කරගනී. පුවක් කොළය මේස අතුරණ ( Table Mats ), කෝපි - ගම්මිරිස් වැනි ද්‍රව්‍ය එකතු කර ගැනීමට ද භාවිතා කෙරේ.

පුවක් කොළපුව විසිතුරු භාණ්ඩ සැකසීමට ද, කල් තබා ගැනීමේ හැකියාව අනුව කෑම එතීම සහ පරිසර හිතකාමී ඇසුරුමක් ලෙස ද උපයෝගී වේ.

පුවක් මල් අපනයන ද්‍රව්‍යයක්වන අතර, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනයටද, සැරසිලි සඳහා ද භාවිතා කෙරේ. ලපටි පුවක් ගෙඩි එනම් " පැන්තුරු " තඹබා වර්ණ කාරක සහ කයිප්පු නිෂ්පාදනය කෙරේ. හාල් පුවක් නිර්වින්දන ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ද ඖෂධ සඳහා ද භාවිතා කරන අතර, පුවක්වල ප්‍රභේදයක් වන " ලේනතැරි පුවක් " වියලා මාල සහ කරාබු වැනි ආභරණ නිෂ්පාදනයට යොදා ගනු ලැබේ.

පුවක් ලෙලි, පාපිසි - බුරුසු - පින්සල් වැනි විසිතුරු ප්‍රයෝජනවත් භාණ්ඩ නිෂ්පාදනයට උපයෝගී කරගනු ලැබේ. අමු පොත්ත, ඉටි ආලේපකර, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කරයි.

පුවක් ගස ආශ්‍රිත ඇති බොහෝ ප්‍රයෝජනවලට අමතරව මෙම නිෂ්පාදන පිළිබඳ පැරුන්නන් සතු තාක්ෂණය සොයා බැලීමට අප යොමු විය යුතුය.

## පුවක් සඳහා වෙළඳපොළ තොරතුරු

| අපනයන වර්ෂය | අපනයන ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | අපනයනය ආදායම (රුපියල් මිලියන) |
|---|---|---|
| 1997 | 3335 | 144.9 |
| 1998 | 5025 | 276.9 |
| 1999 | 4236 | 292.9 |
| 2000 | 580 | 44.2 |
| 2001 | 171 | 8.1 |

කරුංකා කි. 01 ක විදේශීය මිල 2002 වර්ෂයේ රු.350/-ක් වූ අතර, දේශීය මිල රු. 90.0 ක් විය. මෙහිදි කෘමි හානි සහ පුස් ප්‍රමාණය අනුව පළමුවැනි ශ්‍රේණිය, දෙවැනි ශ්‍රේණිය සහ තුන්වැනි ශ්‍රේණිය වශයෙන් ශ්‍රේණිගත කෙරේ.

ඉන්දියාව පුවක් මෙට්‍රික් ටොන් 350,000- 400,000 අතර අලෙවි කෙරේ. ලෝක වෙළඳපොළ - වසරකට මෙට්‍රික් ටොන් 600,000 - 700,000 අතර ප්‍රමාණයක් පෙරදිග රටවලට යවයි.

### පුවක් ගෙඩියේ සංඝටක

| සංඝටක | කොළ පැහැති පුවක් මාස 06 - 07 | හොඳින් ඉදුනු පුවක් මාස 07 - 10 |
|---|---|---|
| ජලය | 69.4 - 74.1 | 38.9 - 56.7 |
| ඊතර් නිස්සාරණය | 32.9 - 56.5 | 23.3 - 29.9 |
| පොලි ෆිනෝල් | 17.2 29.8 | 11.1 - 17.8 |
| ඇරිකොලින් | 0.11 0.14 | 0.12 - 0.24 |
| මේදය | 8.1 - 12.0 | 9.5 - 15.1 |
| අමු තන්තු | 8.2 - 9.8 | 11.4 - 15.4 |
| පොලිසැකරයිඩ | 17.3 23.0 | 17.8 - 25.7 |
| අමු ප්‍රෝටීන | 6.7 - 9.4 | 6.2 - 7.5 |
| අළු | 1.2 - 2.3 | 1.1 - 1.55 |

### පුවක්වල අඩංගු ඇල්කයිඩ

(1) ඇරිකොලින්
(2) ඇරිකයිඩින්
(3) ගුවසින්
(4) ගුවකොලින්
(5) ඇරිකොලයිඩින්

### පුවක් කරුංකා ලෙස හා පෙති පුවක් ලෙස අපනයනය කරන්නෝ

නම සහ ලිපිනය

01. කළමනාකාර,
පැරා එක්ස්පෝ ප්‍රඩක්ට් ප්‍රයිවට්,
30 සී ඇවනිව්,
කොළඹ - 03.

02. කළමනාකාර,
නිසාන් ට්‍රේඩිං කම්පැණි,
320 1/3, ගාලුපාර,
කොළඹ - 03.

03. පී.එම්.මොහොමදාල සහ සමාගම,
187, ප්‍රින්ස් වීදිය,
කොළඹ - 11

04. කළමනාකාර,
කිංග්ස් ෆුඩ් ප්‍රයිවට් ලිමිටඩ්,
15 3/1, ලෝරිස් පෙදෙස,
කොළඹ - 04.

05. කළමනාකාර,
මුබාරක් ට්‍රේඩිං කම්පැණි,
293, ග්‍රෑන්ඩ්පාස් පාර,
කොළඹ - 14.

06. කේ.කේ.ඒෂියා එන්ටර්ප්‍රයිසස්,
385/6, මීගමු පාර
වත්තල.

07. කළමනාකාර,
සී. ඇන්ඩ් ජේ. අපනයනකරුවෝ,
127, කොළඹ පාර,
හල්දුම්මුල්ල.

08. එක්සිවොලංකා ප්‍රයිවට් ලිමිටඩ්,
245/50, අවිස්සාවේල්ල පාර,
වැල්ලම්පිටිය.

09. අක්බාර් බ්‍රදර්ස් ලිමිටඩ්,
334, ටී.බී.ජයා මාවත,
කොළඹ - 10.

10. අෆාර් ට්‍රේඩර්ස් ලිමිටඩ්,
3, හැව්ලොක් පෙදෙස,
කොළඹ - 05.

### පුවක් නිෂ්පාදන සහ අතුරු නිෂ්පාදනය කරන්නෝ

| | |
|---|---|
| ○ සී.කරුණාරත්න මහතා, "සුසින" අඩුල්ල, උඩතලවින්න රඹුක්කන. | දේශීය වශයෙන් රුපියල් ලක්ෂ 25 ක් වසරකට ආදායමැති කර්මාන්තයකි. |
| ○ කේ.ප්‍රේමසිරි මහතා, 232, ඉහල මානියන්ගම, අවිස්සාවේල්ල. | විසිතුරු භාණ්ඩ |
| ○ ගාමිනි රත්නායක මහතා, පොල්වත්ත වතුයාය, වලේවෙල - මාතලේ. | කොළපත් ආශ්‍රිත නිෂ්පාදන. |